# දේශගුණ විපර්යාසවලට අනුගතවීම සඳහා පාරම්පරික දැනුම


## ටී.එම්. අනුරුද්ධ තෙන්නකෝන්

**පරිසර කළමණාකරන නිලධාරි, ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය**

**පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය**


වර්තමානයේ දේශගුණික විපර්යාස පිළිබඳ ලොව පුරාම වැඩි අවධානයක් යොමුව ඇත. සාමාන්‍ය දේශගුණික රටාවට වෙනස් අන්දමින් හා හදිසියේ ඇතිවන දේශගුණික වෙනස්කම් දේශගුණික ආන්තික තත්ත්වයන් හේතුවෙන් ලොව පුරාම ජනතාව විටින් විට අපදාවන්ට ලක්වේ. මේ හේතුව නිසාම හදිසියේ වෙනස්වන කාලගුණික තත්ත්වයන් පිළිබඳ නිවැරදි අනාවැකි පළකිරීමට සෑම රටක්ම වගකීමෙන් කටයුතු කරමින් ඇත. එසේම දේශගුණ විපර්යාස අවම කිරිමට ලොව පුරාම අවධානය යොමුව ඇති අතර ජාතික හා අන්තර්ජාතිකව ඒ පිළිබඳව අවධානය යොමුව ඇත.

යම්කිසි ජන කොටසක් මගින් දරා සිටින දැනුම පාරම්පරික දැනුම වශයෙන් හඳුන්වයි. පාරම්පරික දැනුම පරිසරය විසින්ම ගොඩනගන ලද දැනුමකි එසේම එය අනාදිමත් කාලයක සිට දැන පුරුද්දෙන්, දැක පුරුද්දෙන්, කළ පුරුද්දෙන් හා පල පුරුද්දෙන් පරිසරය අනුසාරයෙන් ගොඩනගන ලද දැනුමකි. මේ නිසාම පාරම්පරික දැනුම තුල පරිසරය සමග ඇති බැඳීම ඉතා පැහැදිලි සාධකයකි. කට වහරින් පරම්පරා ඔස්සේ සම්ප්‍රේෂණය වීමට අමතරව භාවිතාවන ස්ථානයට හා අදාල සංස්කෘතියට සුවිශේෂීය වීම පාරම්පරික දැනුමේ සෙසු සුවිශේෂීය ලක්ෂණයන්ය.

සමස්ථයක් ලෙස පාරම්පරික දැනුම කෘෂිකර්මාන්තය, දේශීය වෛද්‍ය ක්‍රමය, වාරි තාක්ෂණය වැනි සියළුම විෂය ක්ෂේත්‍රයන් තුල අන්තර්ගත අතර පාරම්පරික ආනාවැකි පලකිරීම දේශගුණික විපර්යාසයන් පිළිබඳ අප මුතුන්මිත්තන් සතු දැනුම කියාපාන සාධකයකි.

පාරම්පරික දැනුම ආශ්‍රයෙන් සුභ අසුබ නිමිති, නැකත් ශාස්ත්‍රය, දූත ලක්ෂණ පරික්ෂාව ආදි සියල්ලෙන්ම පොදුවේ ඉදිරි කාලය පිළිබඳව හෝ ඉදිරි කාලයේදී සිඳුවිය හැකි තත්ත්වයන් පිළිබඳව අනාවැකි පලකිරිම සිදුකරයි. මෙය අතීතයේ පටන්ම ජන සමාජයේ පැවත එන ක්‍රමවේදයකි. කෘෂිකාර්මික රටක් වශයෙන් එහි වැදගත්කම අතිමහත් විය. ඒ නිසාම සිව් සැට කලා අතර මේඝ පටල ශාස්ත්‍රයට එක් කලාවක් ලෙස සලකනු ලැබීය. කලට ගොවිතැන යන්න පාරම්පරික කෘෂිකර්මාන්තයේ මූලික සිද්ධාන්තයයි. යායේ එක් කලට ගොවිතැන් නොකිරීම වරිග තහංචියකට ලක්වීමකට තරම් බරපතල වැරද්දක් ලෙස සලකා ඇත.

පාරම්පරික දැනුම මගින් මිනිසා සිය පරිසරයේ දක්නට ලැබෙන විවිධ වෙනස්කම් සියුම් ලෙස නිරීක්ෂණය කර එමගින් ඉදිරියේ ඇතිවන පාරිසරික හා දේශගුණික තත්ත්වයන් පිළිබඳ අනාවැකි පලකර ඇත. මෙම දැනුම වර්තමාන ඇතිවන දේශගුණික විපර්යාසයන් පිළිබඳව අනාවැකි පලකිරීම සඳහාත් යොදාගත හැකිද යන්න පුළුල්ව විමසා බැලිය යුතු කරුණකි. පාරම්පරික දැනුම ඒ ඒ ප්‍රදේශයන්ට සුවිශේෂීය වීම නිසා අනාවැකි පලකිරීමට යෙදා ගැනෙන සම්පත් වෙනස්වීම අනුව එක් එක් දැනුම් පද්ධතිවල වෙනස්කම් හෝ පැවතීමද සැලකිය යුතු කරුණකි.

මෙයට සරලම උදාහරණය ලෙස රජරට ප්‍රදේශයේ හමුවන මෙම අනාවැකිය දැක්විය හැක. එනම් මෙම කන්නයේ අවට පරිසරයේ ගස්වල දිවුල්,කරඹ වැනි කටුසර පලතුරු ඉතා අඩුවෙන් හටගෙන ඇත්නම් ඉදිරි කන්නයේ ලැබෙන වර්ෂාව අඩුය. එසේම මෙම කන්නයේ එම පලතුරු ඉතා සුලභ නම් ඉදිරියේ වැඩි වර්ෂාවක් ලැබෙනු ඇත යන්නයි. එසේම සාමාන්‍යයෙන් ප්‍රමාණයෙන් විශාල දිවුල්

ගෙඩි හටගන්නා ගසක යම් වාරයකදී ප්‍රමාණයෙන් කුඩා දිවුල් පල දරන්නේ නම් එයද ඉදිරි කන්නයේ අඩු වර්ෂාවක් ලැබීමේ පෙරනිමිත්තක් බවය.

මෙවැනි දැනුම ක්ෂේත්‍රයේ සම්මත කරගැනිමට දිගුකාලයක් තොරතුරු රැස්කල විමර්ශණය කල යුතුය. එසේම දිවුල් හා කරඹ වැනි ශාක හමුනොවන ප්‍රදේශවල ඒ වෙනුවට වෙනත් ශාක යොදා ගන්නේද යන්න පාරම්පරික දැනුම රැස්කිරීමේදී තවදුරටත් විමසිය යුතුය.

පාරම්පරික දැනුමෙහි මෙරට හමුවන සුලභතම කාලගුණික ආනාවැකි තුනක් පමණ හඳුනාගත හැක. එනම් උදැසන හා සවස් කාලයේ මෙරු ඉගිල්ලේනම් වැසි කාලය ඉක්මනින් උදාවනන බව, දිවාකල දි දැකිය හැකි කළු කුහුඹුවන්ගේ හෝ කඩියන්ගේ කලබලකාරි හැසිරිම හා කළු කුහුඹුවන් පේලි ලෙස ඔවුන්ගේ බිත්තර රැගෙන නිවෙස්තුලට හෝ වෙනත් ස්ථානයන්ට යාම සහ උදැසන මීහිදුම පැවතීම හා තරමක් දිවා කාලය වනතුරු සීතල පැවතීම ඉදිරි කාලගුණය වියලි හා වැසි රහිත වන බවයි. මෙම අනාවැකි දෙකම කාලයක් තිස්සේ සමාජයේ පැවත එන සහ සත්‍යය වශයෙන් පිළිගැනෙන අනාවැකියන්ය.

ගසක වඩුකුරුලූ කූඩු ඉතා පහතින් දැක ගත ශැකි නම් ඉදිරි කන්නයේ වර්ෂාව අඩුවන බවත්, එම කූඩු ගස්වල ඉහළ ඇත්තම් ඉදිරියේ වැඩි වර්ෂාවක් ලැබෙන බවත් රජරට ප්‍රදේශයේදී වාර්තාවූ තවත් පාරම්පරික අනාවැකියකදී සඳහන් විය. සතුනට හදිසියේ ඇතිවන ස්වභාවික විපත් කල් ඇතිව හඳුනාගත හැකි බව දැන් පිළිගන්නා මතයකි. ඒ අනුව හදිසියේ ඇතිවන ජල ගැලීම් වලින් කුරුලූ කූඩ හා පැටවුන් ආරක්ෂා කරගැනීමට හැකියාව ලැබෙන බව අවබෝධකරගත හැක. එසේම කිරලාගේ බිජු ලෑම අනුවද ඉදිරියේ දි ලැබෙන වර්ෂාව පිළිබඳ අනාවැකියක් හමුවේ. ඒ අනුව කිරලා වැවක ජලය සාමාන්‍යයෙන් රැඳෙන ප්‍රදේශයක බිම බිත්තර දැමුවහොත් ඉදිරියේ ලැබෙන වර්ෂාව අඩු බවත්, වැව් තාවුල්ලේ මැද කලාපයේ බිත්තර දැමුවහොත් මධ්‍යම ප්‍රමාණයේ වර්ෂාවක් ලැබෙන බවත් බිජු ලෑම වැව් තාවුල්ලේ ඉහල කෙලවරට ආසන්නවම ඇත්නම් ඉදිරියේදී අධික වර්ෂාවක් ලැබෙන බවත් කියැවේ.

එසේම මොනරාගල ප්‍රදේශයෙන් හමුවන පාරම්පරික කාලගුණික අනාවැකියක් පරිදි නිදැල්ලේ සිටිනා ගවයන් දිවාකල ඉතා ඉක්මනින් හා හදිසි ආකාරයට තණකොල කනවානම් ඉක්මනින් හා කෙටි වෙලාවකින් වර්ෂාවක් ලැබේ. එම ගවයන් අලසව තණකොල කන්නේනම් ඉදිරි කාලය තුල වැසි නොලැබෙනු ඇත. මෙය ඉතා කෙටි කාලයක් පිළිබඳව වන අනාවැකියකි. එසේම අහසේ නිරිත දිශාවෙන් වැසිකලූ මෝදුවන්නේනම් හොඳ වර්ෂාවක් ලැබේ යන්න සාමාන්‍යයෙන් දිවයින පුරාම පාහේ අතීතයේ යොදා ගැනුනු දැනුමකි. එමෙන්ම එම දිශාවෙන් මෝදුවන වැසි වලාකුළු වල තද හා ලා පැහැය අනුව පතිත වන වර්ෂාවේ ප්‍රමාණය හා වර්ෂාව පවතින කාලය ද ප්‍රකාශකල හැකි බව බෙලිහුල්ඔය ප්‍රදේශයේ කල කරුණු විමසුම් වලදි සනාථ විය.

වයඹ පළාතේ ගල්ගමුව ප්‍රදේශයේ දි වාර්තා වී ඇති පාරම්පරික දැනුමකදී වෙල් කකුලූවන් පොලව තුල සිදුරු සෑරීමේදී පොළව තුලට කෙලින්ම යන ආකාරයට සිදුර (ගුල) සකස්කර ඇත්නම් ඉදිරි කන්නයේ අඩු වර්ෂාවක් ලැබෙන බවත් එසේම කකුලූවන් පළමුව කෙලින්ම පොළව තුලට හා පසුව නැවත ඉහළට ගමන්කර ඉංග්‍රීසි u අකුරක හැඩය ගන්නා පරිදි සිදුර සකස්කර ඇත්නම් ඉදිරි කාලයේ වැඩි වර්ෂාවක් ලැබෙන බවත් වාර්තා වී ඇත.

මෙම ලක්ෂණ පදනම්කරගෙන ඉදිරි කන්නය සඳහා ලැබෙනු ඇතැයි අනුමාන කරන වර්ෂාව අනුව යොදාගන්නා වී වර්ග (බාල වී හෝ වැඩිමල් වී) , නියගයට ඔරොත්තු දෙන ධාන්‍ය (තණ හාල්, මෙනේරි, කුරක්කන් ආදිය) තෝරාගැනීම සිදුකර ඇත.

ධීවර කර්මාන්තය සැලකීමේදී ප්‍රධාන වශයෙන් කරදිය හා කිවුල් දිය ධීවර කර්මාන්කයට අදාල අනාවැකි හමුවේ. මෙහිදී ප්‍රධාන වශයෙන් දවසේ එක් එක් කාලවලදී මුහුදේ දැකිය හැකි වර්ණයන්

ධීවර කාර්මිකයන් සැලකිල්ලට ගනී. එසේම දැල් වලට හසුවන කුඩා මසුන් වර්ග අනුවද ඔවුන් ඉදිරි කාලයේ මුහුදේ රළු තත්ත්වය පිළිබඳ අනාවැකි පවසයි. එම් පිළිබඳ ඉදිරියේදී විධිමත් අධ්‍යයනයක් කිරීම වැදගත්ය.

දේශගුණ විපර්යාසයන් අවම කිරීම සඳහා වන සම්පත් රැකගැනීම එක් ක්‍රමෝපායකි. හානිය අවම වන පරිදි වන සම්පත් භාවිතය පාරම්පරික දැනුමේ අන්තර්ගත අතර එහිදි මානව අවශ්‍යතා සඳහා යොදාගැනෙන ශාක දිගුකලක් ප්‍රයෝජනයට ගතහැකි වන පරිදි නෙලාගැනිමෙන් අනවශ්‍ය වන හරනය වලක්වා ඇත. මෙහිදි යොදාගන්නා ලද සරලම ක්‍රමය වන්නේ සඳ අවපස කාලයට (කරුවලට හෝ අමාවක දිනට) ශාක කපා ගැනීමයි. දැව ශාක , උණ ගස් වේවැල් ඇතුළු සෙසු වැල් වර්ග මෙලෙස ලබාගෙන ඇත. මෙලෙස අවපස කාලයට කපාගන්නා ශාක වලට කෘමි හානි සිදුවීම ඉතා අල්ප බව සත්‍ය කරුණකි. මේ නිසා නැවත නැවත වනාන්තරයෙන් ශාක කපා ගැනීමට අවශ්‍යය නොවූ අතර එමගින් වන සම්පත් සුරැකුනි.